**ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය**

---------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 176 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් (SA-52) රු.22,907,740 ක් වුවද**,** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.15,152,783 ක් වශයෙන් එනම් රු.7,754,957 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.22,907,740ක් ලෙස දක්වා තිබුනේ අත්තිකාරම් බි ගිණුමේ සිදුවූ වැරදි හා වැරදි නිවැරදි කිරීම්වල එකතුවෙන් වන අතර මූල්‍ය ප්‍රකාශ දක්වා ඇති රු.15,152,783 ක අගය තුල වැරදි හෝ වැරදි නිවරදි කිරීමේ අගයන් ඇතුලත් නොවේ.<br>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අත්තිකාරම් දත්ත ලබාගන්නා ඒ.සී.ඒ-5 ආකෘතියේ මු.රෙ. 503(I) යටතේ සිදු වූ හර හා බැර වට්නාකම් ඉවත්කල අගයන් දක්වා ඇති බවට සටහනකින්ද දක්වා ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර පොත් අනුව දැක්විය යුතුවීම. |
| **(ii)** | භාණ්ඩාගාර පොත් අනුව (SA-52) අත්තිකාරම් ගෙවීම් රු.21,464,778 ක් වුවත්**,** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.13,709,820 ක් වශයෙන් එනම් රු.7,754,958 කින් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.21,464,778 ක් දක්වා ඇත්තේ අත්තිකාරම් බි ගිණුමේ සිදුවූ වැරදි හා, වැරදි නිවැරදි කිරීම්වල එකතුවෙන් වන අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.13,709,820 ක අගය තුල වැරදි හෝ වැරදි නිවැරදි කිරීමේ අගයන් ඇතුලත් නොවේ. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අත්තිකාරම් දත්ත ලබාගන්නා ඒ.සී.ඒ-5 ආකෘතියේ මු.රෙ. 503 (I) යටතේ සිදු වූ හර හා බැර වටිනාකම් ඉවත්කල අගයන් දක්වා ඇති බවට සටහනකින් ද දක්වා ඇත. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති මුළු වියදම් අගය රු.2,813,893,282 නිවැරදි බවත්**,** වැරදි හර හා බැර**,** වැරදි නිවැරදි කිරීමට සිදුකල හර හා බැර අගයන් සහිත වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනය කිරීමේ හැකියාව අහිමි වන බවද තවදුරටත් දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර පොත් අනුව දැක්විය යුතුවීම. |
| **(iii)** | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් (SA-30) රු.1,470,508 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.485,884 ක් වශයෙන් එනම් රු.984,624 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ලැබීම් අතර වෙනස වන රු.984,624, වෙළඳ නාවික ලේකම් කාර්යාලය CIGAS ගිණුම්ගත කිරීමේදී සිදුකල වරද, පැවති රාජ්‍ය අමාත්‍යාංශවල ශේෂ මාරු වීම් , වැරදියට ගිණුම් ගත කළ අගයන් **,** භාණ්ඩාගාය මඟින් වැරදි නිවැරදි කිරීම්වලින් සැකසී ඇත.<br>වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මුදලක් | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර පොත් අනුව දැක්විය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | අප අමාත්‍යාංශයේ තැන්පතු ගිණුමේ CIGAS පරිගණක වැඩසටහනට ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් අප අමාත්‍යාංශයේ තැන්පතු ගිණුමට ගිණුම්ගත වීමෙනි. එම වරද ගිණුම් වර්ෂය තුල නිවැරදි කරගෙන ඇත. පැවති රාජ්‍ය අමාත්‍යාංශවල තැන්පතු ශේෂ මාරුවී තිබුණද අග්‍රිම ශේෂ මෙම අමාත්‍යාංශයට මාරු වී නොතිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට එම ශේෂයන් ඇතුලත් කර නොගන්නා ලදී.<br>තැන්පතු ගිණුමට අදාළ වරද ගිණුම්ගත කර නිවැරදි කර ඇත. භාණ්ඩාගාරය හරහා ගිණුම් ගත කළ රු.425 ට ද හේතුව වැරදි නිවැරදි කිරීමකි. එබැවින් එම අගයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේදී සැලකිල්ලට නොගන්නා ලදී. | |
| **(iv)** | භාණ්ඩාගාර පොත් අනුව (SA-30) තැන්පතු ගෙවීම් රු.1,512,284 ක් වී තිබුණත්**,** එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.485,884 ක් වශයෙන් එනම් රු1,026,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ගෙවීම් අතර වෙනස වන රු.1,026,400 ට වෙළඳ නාවික ලේකම් කාර්යාලය CIGAS ගිණුම්ගත කිරීමේදී සිදුකල වරද, වෙළඳ නාවික ලේකම් කාර්යාලය CIGAS ගිණුම්ගත කිරීමේදී සිදුකල වරද, පැවති රාජ්‍ය අමාත්‍යාංශවල ශේෂ මාරු වීම්, තැන්පතු ගිණුමට අදාළ වැරදි, වැරදියට ගිණුම් ගත කළ අගයන්, භාණ්ඩාගාරය මඟින් වැරදි නිවැරදි කිරීම්වලින් සැකසී ඇත.<br>වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මුදලක් අප අමාත්‍යාංශයේ තැන්පතු ගිණුමට ඇතුලත්ව ඇත්තේ එම කාර්යාලය විසින් CIGAS පරිගණක වැඩසටහනට ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් අප අමාත්‍යාංශයේ තැන්පතු ගිණුමට ගිණුම්ගත වීමෙනි. එම වරද ගිණුම් වර්ෂය තුල නිවැරදි කරගෙන ඇත. තැන්පතු ගිණුමට අදාළ වරද ගිණුම්ගත කර නිවැරදි කර ඇත. භාණ්ඩාගාරය හරහා ගිණුම් ගත කළ රු.425 ට ද හේතුව වැරදි නිවැරදි කිරීමකි. එබැවින් එම අගයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේදී සැලකිල්ලට නොගන්නා ලදී. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංඛ්‍යා භාණ්ඩාගාර පොත් අනුව දැක්විය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| **(v)** | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් ලෙස වෙනත් ශිර්ෂ විසින් අමාත්‍යාංශයේ ශිර්ෂයට බැර කළ අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.11,049,908 ක් ලෙස දක්වා ඇතත්, භාණ්ඩාගාර ආකෘති SA-51 අනුව නිවැරදි වටිනාකම රු.7,845,601ක් වුයෙන්, එකතු වටිනාකම රු.3,204,307ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ලබාදුන් පිළිතුරු වෙතද ඔබගේ අවධානය යොමුකරවන අතර 2023 වර්ෂය තුළදී මෙම අමාත්‍යාංශයට, පැවති රාජ්‍ය අමාත්‍යාංශ 02 ක් ඒකාබද්ධ වී ඇති හෙයින් එම ඒකාබද්ධවීම්වලට අනුකූලව සුදුසු පරිදි ගැලපීම් සිදුකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර ඇති බව දන්වා සිටින අතර අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය වන රු.20,709,725,224 නිවැරදි බවද දන්වා සිටිමි. | දෙපාර්තමේන්තු පොත් අවසාන වශයෙන් නිවැරදි කර ගැනීම භාණ්ඩාගාරය විසින් දී ඇති දිනවකවානු තුළ සිදු කර ගත යුතු අතර එසේ සිදු කළවිට නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල වන බැවින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගැලපීම් භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ යුතුවීම. |
| **(vi)** | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් ගිණුමට කරන ලද හර කිරීම වටිනාකම රු.5,299,093 ක් ශේෂ පිරික්සුම අනුව දක්වා ඇතත් සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් ලෙස දක්වා නොතිබුණි. | | |
| **(vii)** | වෙනත් ශීර්ෂ විසින් වාර්තාකරණ ආයතනයට අදාළ තැන්පත් ලබාගැනීම් වටිනාකම රු.984,599 ක් භාණ්ඩාගාර ආකෘති SA-30 හා ශේෂ පිරික්සුම අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් ලෙස දක්වා නොතිබුණි. | | |
| **(viii)** | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් ගිණුමට කරන ලද හර කිරීම් භාණ්ඩාගාර ආකෘති SA-51 අනුව රු. 3,462,970 ක් වී තිබුණත්, සැසඳුම් ප්‍රකාශයේ අඩුකිරීම් ලෙස රු. 9,421,294 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සැසඳුම් ප්‍රකාශයේ රු.5,958,324 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| **(ix)** | ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම රු.8,053,111ක් වී තිබුණද, එම වටිනාකම අග්‍රිම | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ලබාදුන් පිළිතුරු වෙතද ඔබගේ අවධානය යොමුකරවන අතර 2023 වර්ෂය තුළදී මෙම අමාත්‍යාංශයට, පැවති රාජ්‍ය අමාත්‍යාංශ 02 ක් ඒකාබද්ධ වී ඇති හෙයින් එම ඒකාබද්ධවීම්වලට අනුකූලව සුදුසු පරිදි | දෙපාර්තමේන්තු පොත් අවසාන වශයෙන් නිවැරදි කර ගැනීම භාණ්ඩාගාරය විසින් දී ඇති දිනවකවානු තුළ සිදු කර ගත යුතු අතර එසේ සිදු කළවිට නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල වන |

| | | | |
|---|---|---|---|
| | සැසඳුම් ප්‍රකාශයේ අඩුකිරීම් ලෙස දක්වා නොතිබුණි. | ගැලපීම් සිදුකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර ඇති බව දන්වා සිටින අතර අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය වන රු.20,709,725,224 නිවැරදි බවද දන්වා සිටිමි | බැවින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගැලපීම් භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ යුතුවීම |
| **(x)** | වෙනත් ශීර්ෂ විසින් වාර්තාකරණ ආයතනය වෙනුවෙන් කරන ලද තැන්පත් ගෙවීම් භාණ්ඩාගාර ආකෘති SA-30 අනුව රු.1,026,375ක් වුවද**,** සැසඳුම් ප්‍රකාශයේ එය අඩුකිරීම් ලෙස දක්වා නොතිබුණි | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ලබාදුන් පිළිතුරු වෙතද ඔබගේ අවධානය යොමුකරවන අතර 2023 වර්ෂය තුලදී මෙම අමාත්‍යාංශයට, පැවති රාජ්‍ය අමාත්‍යාංශ 02 ක් ඒකාබද්ධ වී ඇති හෙයින් එම ඒකාබද්ධවීම්වලට අනුකූලව සුදුසු පරිදි ගැලපීම් සිදුකර අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර ඇති බව දන්වා සිටින අතර අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය වන රු.20,709,725,224 නිවැරදි බවද දන්වා සිටිමි | දෙපාර්තමේන්තු පොත් අවසාන වශයෙන් නිවැරදි කර ගැනීම භාණ්ඩාගාරය විසින් දී ඇති දිනවකවානු තුළ සිදු කර ගත යුතු අතර එසේ සිදු කළවිට නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල වන බැවින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගැලපීම් භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ යුතුවීම |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් ලැබීම් රු. 4,102,876 ක් ලෙස දක්වා තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් කළ ශේෂ පිරික්ෂුම අනුව එම ලැබීම් රු. 23,115,251 ක් වී තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.19,012,375 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශ ශේෂ පිරික්සුම තුල පැවති ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ණය ශේෂ පවරා ගැනීමට අදාළ ගණුදෙනු, එම පවරා ගැනීමේදී සිදු වූ වැරදීම් මෙන්ම එම වැරදි නිවැරදි කිරීම් හා පැවති ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ණය ශේෂ පවරා ගැනීමේදී සිදු වූ වැරදි නිවැරදි කිරීමේ ගිණුම් සටහන්ද ඇතුලත් වේ. තවද පැවති රාජ්‍ය අමාත්‍යාංශවල අග්‍රිම ශේෂ හා මුදල් ශේෂ මෙම අමාත්‍යාංශයට පවරා දී නොමැති හෙයින් අදාළ සියලුම ගැලපීම් සිදුකර ගිණුම් තොරතුරු වල සංසන්දනාත්මක බව ආරක්ෂා වන පරිදි ගිණුම් තොරතුරු ඉදිරිපත් කර ඇත. | දෙපාර්තමේන්තු පොත් අවසාන වශයෙන් නිවැරදි කර ගැනීම භාණ්ඩාගාරය විසින් දී ඇති දිනවකවානු තුළ සිදු කර ගත යුතු අතර එසේ සිදු කළවිට නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල වන බැවින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගැලපීම් භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ යුතුවීම. |
| **(ii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් වැය කිරීම් යටතේ අත්තිකාරම් ගෙවීම් රු.4,288,526 ක් ලෙස දක්වා තිබුණි. නමුත් විගණනයට ඉදිරිපත් කළ ශේෂ පිරික්ෂුම | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා ඇති අත්තිකාරම් ගෙවීම් අගයන් ශේෂ පිරික්සුමේ දක්වා ඇති අත්තිකාරම් ගෙවීම් අගයන්ගෙන් වෙනස්වීමට හේතු වී ඇත්තේ අමාත්‍යාංශ ශේෂ පිරික්සුම තුල පැවති ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ණය ශේෂ පවරා ගැනීමට අදාළ ගණුදෙනු**,** එම පවරා | දෙපාර්තමේන්තු පොත් අවසාන වශයෙන් නිවැරදි කර ගැනීම භාණ්ඩාගාරය විසින් දී ඇති දිනවකවානු තුළ සිදු කර ගත යුතු අතර එසේ සිදු කළවිට නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල වන බැවින් ඒ අනුව |

| | | |
|---|---|---|
| අනුව එම ගෙවීම් රු.23,300,901 ක් වී තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.19,012,375 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගැනීමේදී සිදු වූ වැරදීම් මෙන්ම එම වැරදි නිවැරදි කිරීම් හා පැවති ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය, සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ණය ශේෂ පවරා ගැනීමේදී සිදු වූ වැරදි ගිණුම් සටහන් සහ පැවති රාජ්‍ය අමාත්‍යාංශවල අග්‍රිම ශේෂ මෙම අමාත්‍යාංශයට පවරා නොදුන් බැවින් සුදුසු පරිදි සියලු ගැලපීම් කර ගිණුම් තොරතුරු වල සංසන්දනාත්මක බව ආරක්ෂා වන පරිදි ගිණුම් තොරතුරු ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගැලපීම් භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ යුතුවීම. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | හානි පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 (1) ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | **හානි ලේඛනය.මු.රෙ. 110 (1) ආකෘතිය**<br><br>මෙම අමාත්‍යාංශයට අයත් වාහන අනතුරට ලක්වීමෙන් සිදුවන හානි සම්බන්ධයෙන් වූ හානි ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛනය 2023.04.24 දින ජාතික විගණන කාර්යාලයේ අධීක්ෂණ කටයුතු සඳහා යොමු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.<br>එම හානි ලේඛණයේ සහ මු.රෙ. 110 (1) අකෘතිය අනුව එකී ආකෘතියේ අංක 06, 08, 10 සහ 11 ට සඳහන් කරුණු පමණක් අමාත්‍යාංශයේ හානි ලේඛණයෙහි සඳහන්ව නොමැත. එබැවින් ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි අමාත්‍යාංශයේ හානි ලේඛනයේ මු.රෙ. 110 (1) ආකෘතිය අනුව සංශෝධනය කර යාවත්කාලීව පවත්වා ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව යාවත්කාලීනව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(ii)** | ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | **ඇප ලේඛනය**<br>ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයින්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කොට පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| **(iii)** | වාහන ලොග් පොත්<br>මුදල් රෙගුලාසි 1645(ආ) ප්‍රකාරව දෙපාර්තමේන්තු වාහන මාණ්ඩලික නිලධාරියකු හෝ | මෙම අමාත්‍යාංශය සතුව වාහන 45 ක් පවතින අතර එම සියළුම වාහන සඳහා 267 වැනි පොදු ආකෘති පත්‍රය පරිදි වෙන් වෙන් වශයෙන් වූ ලොග් පොත් පවත්වාගෙන යනු ලබයි.එම එක් එක් වාහනයේ සිදු කරනු ලබන අළුත්වැඩියා/ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් | මුදල් රෙගුලාසි 1645 (ආ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම |

| | | |
|---|---|---|
| වගකිවයුතු නිලධාරියකු හෝ භාරයේ තැබිය යුතු අතර එම නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රය පරිදි වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි ලිවිය යුතු සියලුම සටහන් ලියනු බවට වගබලා ගත යුතුයි. එහෙත් අමාත්‍යාංශයේ වාහන ලොග් පොත් 25ක් පිළිබඳ නියැදි පරීක්ෂාවේදි වාහනය පිළිබඳ විස්තර අසම්පූර්ණව පවත්වාගෙන යාම, දැවෙන ඉන්ධන ප්‍රමාණය සටහන් කර නොතිබීම, වාර්ෂික බලපත්‍ර යාවත්කාලීන කර නොතිබීම, වාහනයේ භාරකාරත්වය මාරුකිරිම යාවත්කාලීන කර නොතිබීම, ගමන් පිළිබඳ මාසික සාරාංශ සටහන් කර නොතිබීම, පරීක්ෂක නිලධාරින්ගේ සටහන් දක්වා නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | (අළුත්වැඩියා කිරීම, වාර සේවා ඉටු කිරීම, බැටරි අළුතින් යෙදීම, ටයර් යෙදීම) දෛනිකව සටහන් යොදන බව කාරුණිකව සඳහන් කරමි. | වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ඒසීඒ 1 (II) අනුව රු.12,000,000,000 ක් පෙන්නුම් කල ද 2022 සැප්තැම්බර් 02 දිනැති 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනතට අනුව ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුවේ 20.03.02.08 ආදායම් සංකේතය යටතේ දැක්වෙනුයේ රු.16,500,000,000 ක් විය. ඒ | ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන අමාත්‍යාංශය අහෝසි විමත් සමඟ සිවිල් ගුවන්සේවා අධිකාරිය 2022 සිව්වන කාර්තුවේදී මෙම අමාත්‍යාංශයට පවරා දෙන ලද අතර ඒ යටතේ පැවැති සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙම අමාත්‍යාංශය යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක වූයේ මාස 03 ක් තරම් කෙටි කාලයක් පමණි. සිවිල් ගුවන්සේවා අධිකාරිය ආදායම් ඇස්තමේන්තු ලෙස ඉදිරිපත් කරන අගයන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව ආදායම් ඇස්තමේන්තු ලෙස ජාතික අයවැය ලේඛණයේ දක්වනු ලබන අගයන් අතර වෙනසක් පවතින බව ඔබට මෙන්ම අපටද | විසර්ජන පනතට අනුව ආදායම් සංකේතය යටතේ නිවැරදිව මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව දැක්විය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | අනුව මූලික ආදායම් ඇස්තමේන්තුව රු. 4,500,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය වී ඇත. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර සිවිල් ගුවන්සේවා අධිකාරිය ඉදිරිපත් කරන අගයන් හා ජාතික අයවැය ලේඛණයේ ආදායම් ඇස්තමේන්තු එකම අගයකට ගෙන ඒමට කටයුතු කරන බවත් ආදායම් ඇස්තමේන්තු හැකි තරම් තාත්විකව ඉදිරිපත් කිරීමටත්, ආදායම් ඇස්තමේන්තු නිසි පරිදි සංශෝධනය කර ගැනීමටත්, කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | වාර්ෂික ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව මූලික ආදායම් ඇස්තමේන්තුව රු.16,500,000,000 ක් දක්වා තිබුණද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව යටතේ ඒසීඒ 1 (II) ආකෘතියට අනුව එම ඇස්තමේන්තුව රු. 23,000,000,000 ක් ලෙස දක්වා තිබුණි. එසේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.6,500,000,000 ක වටිනාකමකින් සංශෝධනය කිරීම මු.රෙ.85 (2) (ආ) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එයට හේතුව සහිතව ඒ බව ආර්ථික කටයුතු හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | සිවිල් ගුවන් සේවා අධිකාරිය අප අමාත්‍යාංශයට පවරා ගෙන ගතවී ඇත්තේ ඉතාම කෙටි කාලයක් බැවින් එම වැරදි නිවැරදි කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් මු.රෙ.85 (2) (ආ) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එයට හේතු සහිතව, ඒ බව ආර්ථික කටයුතු හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර සංශෝධනය කර ගැනිමට කටයුතු කරන බවද දන්වමි. | මූලික ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය වන විට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් එයට හේතු සහිතව ඒ බව ආර්ථික කටයුතු හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතුවීම. |

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්‍යවශ්‍යයෙන්ම දැරිය යුතු වැය විෂයයන් හදුනාගෙන ප්‍රතිපාදන සලසා නොගැනිම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 05ක එකතුව රු. 147,450,000ක ප්‍රතිපාදන සහ පුනරාවර්තන වැය විෂයයන් 02ක එකතුව රු.270,000ක ප්‍රතිපාදන කිසිදු | වැය විෂයය අංක 176-1-2-0-1403-0/11 හා176-1-7-0-1203-0/11හි ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විදුලිය හා ජලය සඳහා බිල්පත් ඉදිරිපත් නොකිරීමත්, වැය විෂයය අංක 176-1-2-0-2002-0/11,176-1-8-0-2001-0/11 හා 176-1-8-0-2002-0/11හි අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීමත්, වැය විෂයය අංක176-2-4-24-2506-0/17 රට තුල පවතින ඩොලර් හිඟය | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | උපයෝජනයක් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | හේතුවෙන් වානේ, ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමට කොන්ත්‍රාත්කරුට අපහසු වීම හා ඒ නිසා සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් 50 % කට වඩා වැඩි ප්‍රමාණයක් දේශීය වානේ නිෂ්පාදන වෙළඳසැල් වල වානේ තහඩු භාවිත කිරීමට සිදුවීම නිසා ව්‍යාපෘති ව්‍යුහය තුන් වතාවක් ප්‍රතිනිර්මාණය කිරීමට සිදුවීමත්, මිල විචලතාවයන් හේතුවෙන් මිල වැඩි කිරීමට සලකා බලන ලෙස කොන්ත්‍රාත්කරු විසින් කළ ඉල්ලීම කැබිනට් පත්‍රිකාවක් මඟින් වෙත ඉදිරිපත් කර තිබුණද 2022 වර්ෂය අවසන් වන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. එබැවින් 2022 ඇස්තමේන්තුගත මිල වැඩිකිරීමේ මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා නොමැතිවීම සහ 176-2-10-1-2506-0/17හි, EXIM බැංකුව විසින් ණය ලබා දීම සඳහා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ ලේඛනයට හා ණය මුදල වැඩි කර ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022.11.05 දිනැතිව ඉදිරිපත් කළ ලිපියට අනුමැතිය ලබා නොදීම හේතුවෙන් 2022 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නොකිරීම. | |
| **(ආ)** | ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 08ක රු.3,400,528,713ක් හා පුනරාවර්තන වැය විෂයයන් 14ක රු.4,601,679ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 99 ක් දක්වා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 176-1-1-0-1001-0/11හි, 2022 වර්ෂය තුළ අමාත්‍යවරයෙකු නොසිටීම හා සිටි අමාත්‍යවරයා වැටුප් ලබා නොගැනීම, 176-1-1-0-1203-0/11හි, නිලධාරින් නිළ ඇඳුම් දීමනාව ඉල්ලුම් නොකිරීම, 176-1-1-0-1403-0/11හි 2022.05.20 දිනට පෙර සිටි අමාත්‍යවරුන්ගේ නිල නිවාසවල ජලය හා විදුලිය වියදම් දැරීමට සිදු නොවීම, 176-1-1-0-1302-0/11,176-1-8-0-1302-0/11,176-1-8-0-1303-0/11, 176-1-1-0-2002-0/11,176-1-9-0-2002-0/11හි වියදම් දැරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගීම,176-1-2-0-1203-0/11, 176-1-2-0-1205-0/11,176-1-2-0-1508-0/11, 176-1-9-0-1203-0/11,176-1-9-0-1205-0/11,176-1-9-0-1302-0/11,176-1-9-0-1403-0/11,176-1-9-0-1506-0/11, 176-1-9-0-2401-0/11හි අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම, 176-2-4-24-2506-0/12හි ඩොලර් හිඟය හේතුවෙන් වානේ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමට අපහසු වීම මත ව්‍යාපෘති පිරිවැයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වානේ නිෂ්පාදන තහඩු භාවිත කිරීමට සිදුවීම නිසා ව්‍යාපෘති ව්‍යුහය තුන් වතාවක් ප්‍රතිනිර්මාණය කිරීමට සිදුවීම මත ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. එමනිසා අපේක්ෂිත පරිදි ගෙවීම් කටයුතු සිදු නොකිරීම. තවද මිල | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | | විචලතාවය හේතුවෙන් මිල වැඩිකිරිම සඳහා අනුමැතිය නොමැතිවිම මත කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවා නොමැතිවීම, 176-2-4-25-2506-0/12, 176-2-4-25-2506-0/17හි ශක්‍යතා අධ්‍යාන කෙටුම්පත් වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා කෙටුම්පත ව්‍යාපෘති උපදේශක වෙත යවා ඇත.මෙම වාර්තා ආසියානු සංවර්ධන බැංකුවෙන් අනුමැතිය ලැබීමෙන් පසු ගෙවීම් සිදුකිරීමට නියමිත වී තිබීම, 176-2-10-1-2302-0/12හි EXIM බැංකුව විසින් ණය ලබා දීම සඳහා මුලික සුදුසුකම් පරික්ෂා කිරීමේ ලේඛනයට හා ණය මුදල වැඩි කර ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022.11.05 දිනැතිව ඉදිරිපත් කළ ලිපියට අනුමැතිය ලබා නොදීම හේතුවෙන් 2022 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නොකිරීම සහ 176-2-11-1-2506-0/11හි චක්‍රලේඛ අංක 03/2022හි ඇමුණුම Iහි ආරම්භ නොකරන ලද නව ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා තිබීම හා 2281/41 අංක හා 27.05.2022 දිනැති ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශය යටතේ ගැසට් කිරීම. | |
| **(ඇ)** | මුලික ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් වැය විෂයයන් 14කින් එකතුව රු.14,097,049ක් වූ ප්‍රතිපාදන මු.රෙ 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | 176-1-1-0-1203-0/11හි නිලධාරින් නිළ ඇඳුම් දීමනාව ඉල්ලුම් නොකිරීම, 176-1-1-0-1401-0/11හි නිලධාරින් විසින් ප්‍රවාහන දීමනාව වෙනුවට නිළ වාහන ඉල්ලුම් කිරීම, 176-1-1-0-1408-0/11හි ජාතික අයවැය චක්‍රලේඛ 1/2022 ට අනුව නව කල්බදු ගිවිසුම්වලට එළඹීම අවුරා තිබීම, 176-1-1-0-1403-0/11හි 2022.05.20 දිනට පෙර සිටි අමාත්‍යවරුන්ගේ නිල නිවාසවල ජලය හා විදුලිය වියදම් දැරීමට සිදු නොවීම, වැය විෂයයන් 09 ක් සඳහා අමාත්‍යාංශය වර්ෂය පුරාම ක්‍රියාත්මක වේ යැයි අපේක්ෂාවෙන් වාර්ෂික අයවැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් කර ගත්ත ද අංක 2277/53 හා 2022-04-28 දිනැති ගැසට් නිවේදනය අනුව රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම සහ 176-1-8-0-1302-0/11හි වියදම් අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම. | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |
| **(ඈ)** | 176-2-4-25-2506-0/12 හා 176-2-4-25-2506-0/17 (යටිතල පහසුකම් සංවර්ධනය) වැය විෂයයන් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් යටතේ පිළිවෙලින් | කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශක්‍යතා අධ්‍යාන කෙටුම්පත් වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා කෙටුම්පත ව්‍යාපෘති උපදේශක වෙත යවා ඇත. එම වාර්තා අධීක්ෂණය සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත | මු.රෙ 50 අනුව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| රු.637,178,000 ක් හා රු.76,461,360 ක අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.506,136,839 ක් හා රු.46,331,709ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 31 ක් හෙවත් රු.231,041,161ක හා සියයට 46 ක් හෙවත් රු.40,129.651ක අතිරේක ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇති අතර 2022. නොවැම්බර් මස පැවති පළමු තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ අදහස් අවසන් වාර්තාව වෙත ඇතුලත් කර ආසියානු සංවර්ධන බැංකුවෙන් ශක්‍යතා අධ්‍යන වාර්තාව හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා සඳහා අනුමැතිය ලැබීමෙන් පසු ගෙවීම් සිදුකිරීමට නියමිත බැවින් ගෙවීම් සිදුකිරීමට නොහැකිවීම නිසා 176-2-4-25-2506-0/12 හා 176-2-4-25-2506-0/17 වැය විෂයන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් සලසාගත් ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු මඟින් සලසාගත් ප්‍රතිපාදන පිලිවෙලින් සියයට 31ක් හා සියයට 46 ක් ඉතිරි වී ඇත. | |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන නියැදි පරික්ෂාව අනුව 2022 වර්ෂය සඳහා අවස්ථා 65කට අදාළව රු.335,297,489ක බැරකම් 2023 පළමු මාස 02දී නිරවුල් කර තිබුණු අතර මෙම වියදම් 2022 දෙසැම්බර් 31 දිනට වූ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණු අතර වැය විෂයයන් 06කට අදාළව බැරකම් රු.331,168,236ක් ඉතිරිය ඉක්මවා තිබුණි | 2022 බැරකම් වලට අදාල බිල්පත් 2022.12.31 දින වන විටද ගිණුම් අංශය වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොතිබුණු බැවින් 2022 වර්ෂයේ බැරකම් ලේඛණයට එකී බිල්පත් ඇතුලත් නොකරන ලදී. එම බිල්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් වුයේ 2023 වර්ෂයේදීය. එම නිසා 2022 වර්ෂයේ බැරකම් ලේඛණයේ බැරකම් ලෙස හඳුනා නොගැණිනි. 2022 වර්ෂයට අදාල 2022 වර්සයේ ඉදිරිපත් වු සියළු බිල්පත් 2022.12.31 දිනට ගෙවා අවසන් කරන ලදී. | මු.රෙ.94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව බැරකම් වලට නොඑළඹිය යුතුවීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | | |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | **අනුකූල නොවීම** | | |
| **(i)** | මු.රෙ.128(2) (ඇ) ඡේදය | හිග රාජ්‍ය ආදායම් අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කොට ඒවා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2022 ජුනි 30 හා දෙසැම්බර් 31 දිනට අදාලව එම වාර්තා නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ.128 (2) (ඇ) සිවිල් ගුවන් සේවා අධිකාරිය අප අමාත්‍යාංශයට පවරා ගෙන ගතවී ඇත්තේ ඉතාම කෙටි කාලයක් බැවින් හිඟ අදායම් වාර්තා පිලියෙල කිරිමට නොහැකි වූ අතර ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරිමට සටහන් කර ගතිමි. | හිග රාජ්‍ය ආදායම් අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කොට ඒවා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවීම. |
| **(ii)** | මු.රෙ. 1646 ඡේදය | අමාත්‍යාංශය සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන්පත් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඊළඟ මාසයේ 15වන දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 47 කට අදාළ ධාවන සටහන්පත් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.1646 අමාත්‍යාංශය සතු වාහන වලට අදාලව 2022 වර්ෂයේ පරීක්ෂා කරන ලද දෛනික ධාවන සටහන්පත් සහ මාසික සාරාංශ වල මුල් පිටපත් වලින් කොටසක් 2022.11.17 වන දින රජයේ විගණන අංශය වෙත යවා ඇත. අනෙකුත් දෛනික ධාවන සටහන් පත් මේ වන විට පරීක්ෂා කරමින් සිටින අතර කඩිනමින් විගණන අංශය වෙත භාර දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අමාත්‍යාංශය සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන්පත් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඊළඟ මාසයේ 15වන දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු ආනයන හා අපනයන Exim බැංකුව අතර ඇමරිකානු ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට ඩොලර් ණය ගිවිසුමකට 2018 ජනවාරි 10 දින අත්සන් තබා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුම අත්සන් කර වසර 04 කටත් වැඩි කාලයක් ගතවී ඇතත් වරායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීමේ වැඩකටයුතු 2021 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2022 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | (අ) (ආ)<br>ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රජය අතර ඩොලර් ණය සහන ගිවිසුම 2018 ජනවාරි මාසයේ දී අත්සන් කරන ලදී. එම ණය මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීම සඳහා ණය නිදහස් කිරීමේ ගිවිසුම 2018 ඔක්තෝම්බර් මාසයේ දී ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර අත්සන් කරන ලදී. ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට ප්‍රථම උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා පූර්ව සුදුසුකම් කැඳවීම, කෙටි ලැයිස්තුගත ලංසුකරුවන් අතර ටෙන්ඩර්පත් කැඳවීම, සාකච්ඡා පැවැත්වීම සහ සුදුසු උපදේශකවරයා තෝරා ගැනිම, කොන්දේසි සාකච්ඡා කරන අතරතුර උපදේශක ගිවිසුම සකස් කිරීම සහ ගිවිසුම අත්සන් කිරීම, පහත සඳහන් මූලික වැඩබිම් විමර්ශන කටයුතු ව්‍යුහ සැලසුම්, සැලසුම් ඇඳීම, පිරිවිතර, ප්‍රමාණ පත්‍ර සහ ව්‍යාපෘති වාර්තාව (DPR) සමාලෝචනය කිරීම, ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම, (වෙළඹ පහකින් යුතුව) සහ පූර්ව සුදුසුකම් ලේඛණ පිළියෙල කිරීම, ඇතුළු උපදේශක කාර්යයන් ඉටුකිරීම ඇතුළු වෙනත් අනිවාර්ය කටයුතු ගණනාවක් සිදු කල යුතුව තිබුණි. | සැලසුම් සකස් කර ගැනීමට ප්‍රථම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අවශ්‍ය විය හැකි නිෂ්කාශනයන් සහ අනුකූලතාවයන් පිළිබඳ පූර්ව සලකා බැලීමක් කළ යුතුවීම. |
| **(ආ)** | 2022 වාර්ෂික ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව තුල කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරිම ව්‍යාපෘතිය යටතේ රු.797,000,000 ප්‍රතිපාදනය සලසාගෙන තිබුණි. එම ප්‍රතිපාදන සලසාගෙන තිබුණේ ප්‍රධාන වැය සඳහා රු. මිලියන 700 ක් හා බදු සඳහා රු.මිලියන 97 ක් වශයෙනි. එසේ වුවද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ වලට අනුව ඉහත සලසාගෙන තිබූ ප්‍රතිපාදන මුදල වන රු.700,000,000 න් දැරූ වියදම රු.55,185,115 කි. | මෙම ඉහත සඳහන් සියළු කාර්යයන් මේ වන විට සම්පූර්ණ කර ඇත.<br>සංශෝධිත සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සහිත පූර්ව සුදුසුකම් ලේඛනය එම ඉන්දියාවේ EXIM බැංකුව විසින් අනුමැතිය සඳහා 2022 ජනවාරි 26 දින ඉදිරිපත් කර ඇත. 2022 නොවැම්බර් මාසයේ දී සවිස්තරාමක ව්‍යාපෘති වාර්තාව සඳහා එකගතාවය ලැබී තිබුණ ද මාස 15ක් ගත වී තිබිය ද පූර්ව සුදුසුකම් සඳහා එකගතාවය මේ දක්වාම ලැබී නොමැත. මෙම ලේඛන දෙකම සඳහා එකගතාවය නොමැතිව ඉදිකිරීම් කොන්ත්‍රාත් කරුවකු සඳහා ටෙන්ඩර්පත් කැඳවීම ආරම්භ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකියාවක් නොමැත.<br>ඉහත සඳහන් ලේඛන දෙක සඳහාම ඉන්දියාවේ EXIM බැංකුවේ එකගතාවය ලැබුණු පසු | -එම- |

| | | |
|---|---|---|
| ඒ අනුව සියයට 8 ක් පමණක් උපයෝජනය කර තිබුණි | ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන් කෙටි ලැයිස්තුගත කිරීමට පූර්ව සුදුසුකම් කැඳවන අතර පූර්ව සුදුසුකම් ක්‍රියාවලිය යටතේ කෙටි ලැයිස්තුගත කරන ලද ලංසුකරුවන් අතර පමණක් ටෙන්ඩර් ඉපිලුම් කරනු ඇත. ඉන්පසුව ටෙන්ඩර් කැඳවීමේ අදියරෙහි දී ඔවුන්ගේ යෝජනා පරිශීලනය කර ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම සඳහා සුදුසු ලංසුකරු තෝරා ගනු ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු සඳහා ටෙන්ඩර් කැඳවීම ආරම්භ කිරීමට හැකියාව ලැබෙන්නේ මෙම සියළු කාර්යයන් සම්පූර්ණ වීමෙන් පසුවය.<br>2022.10.25 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඩොලර් ණය සහනය එක්සත් ජනපද ඩොලර් 61.5 දක්වා වැඩි කර දෙන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය රේඛීය අමාත්‍යාංශය හරහා ඉන්දියාවේ EXIM බැංකුවෙන් ඉල්ලා සිටින ලදී. මේ දක්වා එයට ප්‍රතිචාරයක් නොලැබුන බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ පිළිබඳව කඩිනම් රැස්වීමක් කැඳවන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින ලද අතර, ඒ සඳහා දිනයක් ලැබෙනතුරු අපේක්ෂාවෙන් සිටී. මුළු ව්‍යාපෘති පිරිවැය ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ණය මුදලක් ලබා ගැනීමට අනුමැතියක්/ එකගතාවයක් නොමැතිකම හමුවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට හැකියාවක් නොමැති වීමේ තත්වයට නැවතත් පත්වී සිටී.<br>එබැවින් රාජ්‍ය මට්ටමින් ගත යුතුව ඇති අනුමැතිය/ එකගතාවය /තීරණය නොමැතිව ව්‍යාපෘති කටයුතු මේ වන විට නැවැත්වීමේ තත්වයකට පත්වී ඇත | |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 පෙබරවාරි 06 දිනැති හා 05/2008 දරණ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වාදීම මැයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයෙහි 2.3 වගන්ති ප්‍රකාරව ප්‍රඥප්ති පිළියෙල කිරීම | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008 හි 2.3 වගන්ති ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පරීක්ෂාකාරී විම පිණිස අධීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කලයුතු වන අතර ඒ සඳහා 2021 වර්ෂයේදී කාර්තුමය ඇගයීමක් සිදු කරන ලදි. මෙම අමාත්‍යාශයේ එක් එක් අංශ විසින් ඉදිරිපත් කරන ලද අවසන් කාර්තුවට අදාල තොරතුරු | චක්‍රලේඛය මඟින් දක්වා ඇති පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්ති ක්‍රියාවලිය අධීක්ෂණය හා ඇගයීම සාධාරණ කාල සීමාවකට පසු සිදුකිරීම සඳහා කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම් සඳහා සෑම අමාත්‍යාංශයක් විසින්ම ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර ගැනීම අවශ්‍ය වන අතර මෙහිදී අදාල ආයතන විසින් සැලසුම් කර ඇති පරිදි ප්‍රඥප්ති පිලියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම එකී සේවාවන් වඩාත් ඵලදායිව සහ ගුණාත්මකව සැපයීම තහවුරු වී ඇත්ද යන්න පරීක්ෂාකාරී වීම පිණිස අධික්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කල යුතු වේ. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ 2021 වර්ෂයේදී කාර්තුමය වශයෙන් ඇගයීමක් කර තිබුණද 2022 වර්ෂය සඳහා සහ 2023 ජූලි 31 දින දක්වා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්ති ක්‍රියාවලිය අධීක්ෂණය හා ඇගයීම සිදුකර නොමැති බව විගණනයේදි නිරීක්ෂණය විය. | පරීක්ෂා කිරිමේදී සංශෝධනයන් අවශ්‍ය නොවන බව ඒ ඒ අංශ මඟින් දන්වා තිබේ. එසේ වුවද චක්‍රලේඛය මඟින් දක්වා ඇති පරිදි සාධාරණ කාල සීමාවකට පසු ඇගයීමක් සිදු කිරීම යෝග්‍ය වේ. එම කාල වකවානුව තුළ එම අධීක්ෂණය හා ඇගයීම සඳහා පත් කළ කමිටුවේ නිලධාරීන් දෙදනාගෙන් එක් අයකු පූර්ණ කාලීනව වෙනත් ආයතනයකට ස්ථාන මාරු වූ බැවින් සහ මේ වනවිට ගුවන් සේවා අංශයද මෙම අමාත්‍යාංශයට එක්වූ බැවින් එම අංශයද නියෝජනය වන පරිදි එකී සේවාවන් වඩාත් ඵලදායීව හා ගුණාත්මකව සිදු කිරීම සඳහා නව සාමාජිකයින් දෙදනකු පත් කල බව සඳහන් කරමි.ඒ අනුව විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ගුවන්සේවා අංශයද ඇතුළුව 2023 ජුනි මස 30 වන දිනෙන් අවසන් අර්ධ වර්ෂය සඳහා අධික්ෂණ හා ඇගයීම 2023 ඔක්තෝබර් මස 05 දිනට පෙර සිදු කරන බව දන්වා සිටිමි. | |
| (ආ) | 2008 පෙබරවාරි 06 නිකුත් කළ 05/2008 චක්‍රලේඛයේ 2.3 වගන්ති ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ගතික සංකල්පයක් වන අතර ප්‍රඥප්තිය ආරම්භකොට ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යයනයන්, විශ්ලේෂණයන් මෙන් ම සැලසුම් කිරීම ද නිතර නොකඩවා කල යුතු වේ. එසේ වුවද, 2022 වර්ෂයේ සිට ගුදම් පහසුකම්, බහලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු සහ නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී මෙම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධවීම හේතුවෙන් එහි දැක්ම, මෙහෙවර හා ආයතනයේ කාර්යභාරය පුළුල් වූ බැවින් පවතින පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අවශ්‍ය සංශෝධන සිදුකල යුතු බව විගණනයේ දී නිරික්ෂණය කෙරේ. | 2022 වර්ෂයේ දී ගුදම් පහසුකම්, බහාළුම් අංගන, වරාය පහසුකම් සහ බෝට්ටු සහ නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වීම සිදුවූ අතර එලෙසම 2022.07.22 දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2289/43 අංක දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව එවකට පැවති ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ගුවන් සේවා අංශය වරාය හා නාවික අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධවී වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ස්ථාපිත විය . පසුගිය කාල වකවානු පිළිබඳ සලකා බැලීමේදි වරින් වර මෙම අමාත්‍යාංශය සමඟ වෙනත් අංශ ඒකාබද්ධ කිරීම හා අහෝසි වීම මත දැක්ම හා මෙහෙවර වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යන බවත් විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි එමඟින් එහි කාර්යභාරය පුළුල් වූ බැවින් එම කාර්යභාරය වෙනස්වීම මත ඊට අවශ්‍ය සංශෝධනයන් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට සිදු කරන බව දන්වා සිටිමි. | ආයතනයෙහි කාර්යභාරය පුළුල් වීම මත පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියට අවශ්‍ය සංශෝධන සිදුකල යුතු බව. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 97 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 72 ක් වූයෙන් තනතුරු 15ක පුරප්පාඩු පැවතුනි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක තෘතියික මට්ටමේ තනතුරු 01ක ද්විතියික මට්ටමේ තනතුරු 06ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත. තවද ද්විතියික මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා පුරප්පාඩු පවතින බැව් දන්වමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත වරින් වර ලිපි නිකුත් කරන ලදි. | අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වා ගත යුතුවීම. |
| 2018 ජනවාරි 24 දිනැති හා අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය ලේකම්ගේ රාජ්‍ය අංශ තුල මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයෙහි 1හි සඳහන් පරිදි කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සඳහා ආයතනයට සුදුසු ලෙස සකස් කරනු ලබන වාර්ෂික කාර්යසාධන ගිවිසුම් ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු කලයුතු වේ. එසේ වුවද අමාත්‍යාංශයේ 2022 හා 2023 වර්ෂයන් සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2022 සහ 2023 වර්ෂයන් සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොමැති බව, ජාතික විගණන කාර්යාලයේ විගණන නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමේදී පෙන්වා දුන් හෙයින්, ඉන්පසු 2022 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ කාර්යාල සේවක සේවයේ සහ රියදුරු සේවයේ සේවකයන්ගේ කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ අතර, අනෙකුත් නිලධාරීන්ගේ කාර්යසාධන ගිවිසුම් සකස් කරමින් පවතින බවත්, එම කටයුතු 2023.09.15 දින වන විට අවසන් කරන බව කාරුණිකව දන්වා සිටිමි. 2023 වර්ෂයට අදාළ කාර්යසාධන ගිවිසුම් 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා සකස් කළ යුතු බැවින් 2023 වර්ෂය අවසානය වන විට සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව වැඩිදුරටත් දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව අදාළ වර්ෂයන් වෙනුවෙන් සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු බව. |